# ශ්‍රී ලංකා - චීන සබඳතා රැකගනිමු!

ශ්‍රී ලංකාව අද පවතින ගැඹුරු ආර්ථික, දේශපාලන හා සමාජ අර්බුධය තුළ විදේශ ප්‍රතිපත්තිය සංවේදීව හා නිවැරදිව කළමණාකරණය කිරීම කොපමණ වැදගත්ද යන්න අමුතුවෙන් පැහැදිලි කළ යුතු නැත.

පසුගිය 2022 අගෝස්තු 05 දා විදේශ අමාත්‍යාංශය විසින් කොළඹ චීන තානාපති කාර්යාලය වෙත යැවුනු ලිපියක් මගින් දන්වා තිබුනේ,

01. චීනයේ යුආන් වැංග් 05 (Yuan Wang 5) නැමති පර්යේෂණ නෞකාවට අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීමට හම්බන්තොට වරායට ඇතුලුවීමට අවසරය 2022 ජූලි 12 දා ලබාදුන් බවත්,

02. එහෙත්, මෙම කරුණු පිළිබඳව තවදුරටත් සාකච්ඡා කරන තුරු හම්බන්තොට වරායට එම නැව ඇතුළු කිරීම පමා කරන ලෙසත් ය.

ශ්‍රී ලංකා වරායන් වෙත මෙන්ම, ඒකාබද්ධ යුධ අභ්‍යාස සඳහා ද, අන්රටවලට අයත් යුධ නෞකා මෙරටට පැමිණෙති. මෙසේ මෙරටට වැඩි වශයෙන්ම පැමිණෙන්නේ එක්සත් ජනපදයට අයත් යුධ නෞකාවන්ය. ප්‍රංශයට, ඉන්දියාවට හා වෙනත් රටවලට අයත් නෞකාද විටින් විට පැමිණ ඇත.

මෙම නෞකාව මගින් ඉන්දියාවේ සංවේදී තොරතුරු රැස්කරගැනීමට හැකි බැවින් හම්බන්තොට වරායට ඇතුලුවීමට නැවට අවසර නොදෙන ලෙස බලපෑම් සිදුව ඇති බව දැන ගන්නට ඇත. එම නැවට ඉන්දියාවේ තොරතුරු රැස්කරගැනීමේ හැකියාව තිබේනම් ඒ සඳහා හම්බන්තොට වරායට ඇතුලුවීමට අවශ්‍ය නොවේ. අනෙක් අතට ජූලි 12 දා ලබාදුන් අවසරය මත ලංකාවට යාත්‍රා කරමින් තිබෙන නෞකාවට දැන් හදිසියේ ආපසු හැරෙන්නටද නොහැක.

චීන නෞකාව මෙරටට පැමිනීම වලක්වන ලෙස ඉල්ලා ඉන්දියානු හා ඇමරිකානු තානාපති අංශ විසින් රජයට දැඩි බලපෑමක් එල්ල කළ බවද පැවසේ. චීන පර්යේෂණ නෞකවෙ සම්බන්ධ සිද්ධියේදී පැහැදිලි වන්නේ ඇමරිකානු අධිරාජ්‍යවාදීන් අපගේ විදේශ ප්‍රතිපත්තියට කොතරම් ඇඟිලි ගසන්නේද යන කරුණයි. අපගේ විදේශ ප්‍රතිප්තිය සැකසෙන්නේ රටේ උවමනාවන්ට වඩා විදේශ උවමනාවන්ට බව මින් ගම්‍ය වේ.

ශ්‍රී ලංකාවට විශාල වශයෙන් ආර්ථික ආධාර ලබා දෙන්නේ චීනය හා ඉන්දියාවයි. ඉන්දියාව සමග මෙන්ම, චීනය සමඟ අනවබෝධතා, රාජ්‍ය තාන්ත්‍රික මට්ටමේ විරසක වීම්, අප රටට ඔරොත්තු නොදේ.

මතුව ඇති තත්ත්වය පිළිබඳ අවධානය යොමු කරන ලෙස අධිරාජ්‍ය විරෝධී සියළු දේශපාලන බලවේගයන්ගෙන් ඉල්ලා සිටින අප පක්ෂ එකමුතුව, අන් රටවල් සමඟ පවත්නා සබඳතා, ශ්‍රී ලංකා - චීන සබඳතාවලට හානි නොවන ආකාරයෙන් පවත්වා ගෙන යාම සඳහා ශ්‍රී ලංකා රජයට බලකර සිටින අතර අවසර ලබාදී ඇති පරිදි එම නෞකාවට හම්බන්තොට වරායට ඇතුළුවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ඉල්ලා සිටිමු.

ශ්‍රී ලංකා - චීන ජනතාවන් අතර පවත්නා ශතවර්ෂ ගනනාවක් ඈතට දිවෙන සබඳතා රැකගෙන, ද්වීපාර්ශවීය සබඳතා ආරක්ෂා වන සේ රාජ්‍යතාන්ත්‍රික ක්‍රම මගින් මතුව ඇති ගැටලුව විසඳා ගැනීමට යුහුසුළුව ක්‍රියා කරන ලෙසට රජයට අප බලකර සිටිමු.

විමල් වීරවංශ - නායක
ජාතික නිදහස් පෙරමුණ

වාසුදේව නානායක්කාර - ප්‍රධාන ලේකම්
ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණ

ජී. වීරසිංහ - ප්‍රධාන ලේකම්
ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය

තිස්ස විතාරණ - ප්‍රධාන ලේකම්
ලංකා සම සමාජ පක්ෂය

උදය ගම්මන්පිල - නායක
පිවිතුරු හෙළ උරුමය

අසන්ක නවරත්න - ප්‍රධාන ලේකම්
ශ්‍රී ලංකා මහජන පක්ෂය

පූජ්‍ය අතුරලියේ රතන හිමි - නායක
විජය දරනී ජාතික සභාව

ගෙවිඳු කුමාරතුංග - සභාපති
යුතුකම ජාතික සංවිධානය